**පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය**

# මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

## "දිට්වා" ආපදා තත්වය මත මධ්‍යම පළාත් සභාවේ ආයතන සඳහා සිදුවූ හානිය යථාවත් කිරීමට අතිරේක කාර්ය මණ්ඩලය ලබාගැනීම

"දිට්වා" ආපද තත්වය මත හානියට පත්වූ මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග නැවත යථාවත් කිරීම පිණිස පහත දැක්වෙන තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

### ඉංජිනේරු (ව්‍යුහ සැළසුම්) - තනතුරු 01

- **මාසික දීමනාව :**

  HM 1-1 වැටුප් කේතයේ ආරම්භක වැටුපට අදාළ වන පරිදි මාසික දීමනාව ගෙවනු ලැබේ.

- **සුදුසුකම් :**

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම

  සමග

  ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකු වශයෙන් ලියාපදිංචි වී තිබීම

  සහ

  ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "**කළමනාකාර මට්ටමේ**" තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම සහ එයින් ව්‍යුහ සැළසුම් (මාර්ග ඉදිකිරීම්) ක්ෂේත්‍රයේ අවමය වසර පහ (05) ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

- **වයස :**

  අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය.

**පොදු කොන්දේසි :**

01. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
02. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
03. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
04. සෑම අයදුම්කරුවෙකුම තනතුරට බඳවා ගැනීම සඳහා අදාළ වන සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.
05. රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරනු ලබන්නේ නම් ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුයි.
06. අයදුම්කරුවන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පත සකස්කර එවිය යුතු අතර, තමා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.
07. ඔබ විසින් යොමු කරනු ලබන අයදුම්පත්‍රයේ සඳහන්ව ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් නුසුදුස්සෙකු සේ සලකා ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.
08. අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

**බඳවා ගන්නා ක්‍රමය -**

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනයමත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම්, අයදුම්කරු මෙම තනතුර සඳහා පත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

සුදුසුකම් සපුරා ඇති  අයදුම්කරුවන් විසින් ජීව දත්ත විස්තර ඇතුළත් කර සකස් කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත්ද (සහතික කරන ලද) සමග බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කර 2026.06.12 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**අංක 09,**
**ඇහැලේපොළ කුමාරිහාමි මාවත,**
**බෝගම්බර, මහනුවර.**
**දුරකථන අංකය - 0812204378**

**සාමාන්‍යාධිකාරී,**
**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**මධ්‍යම පළාත.**